# ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (11) 249-8100 ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 20191118

**ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය පිළිබඳ ප්‍රකාශය**

**කොළඹ, නොවැම්බර් 18, 2019:** ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ජනාධිපතිවරණය පිළිබඳව එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ජනතාවට සුබ පතන අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සමඟ වැඩ කිරීමට බලාපොරොත්තු වේ. ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදයට ගැළපෙන නිදහස්, සාධාරණ හා විනිවිද පෙනෙන ජනාධිපතිවරණයක් සමඟ ශ්‍රී ලංකාව සිය ජනරජයේ ශක්තිය හා නැගී සිටීමට ඇති හැකියාව අඛණ්ඩව පෙන්නුම් කරයි. සාමකාමී මැතිවරණයක් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා මැතිවරණ කොමිසමට, ශ්‍රී ලංකා සිවිල් සමාජයට සහ රාජ්‍ය නිලධාරීන්ට අපගේ ගෞරවය හිමිවෙයි. සියලු රටවලට සමෘද්ධිමත් විය හැකි ඉන්දු-පැසිෆික් කලාපයක් පෝෂණය කිරීම, යහපාලනය පුළුල් කිරීම, පුළුල් ආර්ථික වර්ධනය, මානව හිමිකම් හා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය හරහා රටේ ස්වෛරීභාවයට සහයෝගය දැක්වීමට නව ජනාධිපතිවරයා හා ශ්‍රී ලංකාවේ සියලු ජනතාව සමඟ අපගේ වැඩ කටයුතු කරගෙන යාමට අපි සූදානම්ව සිටිමු.